ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසලොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව



බෞද්ධෝදය

"ධම්මෝ හවේ රකඛති ධම්මචාරි"

71 වර්ෂය - ශ්‍රී බු.ව 2559 2016 අප්‍රේල් 21 බක් කලාපය

පානදුර වෑකඩ වලව්වත්ත ශ්‍රී රත්නාරාමය, නාකුළුගමුව සීනිමෝදර ජයසුමනාරාම මහා විහාරය, ඕහිය විවේකාශ්‍රමය හා රත්මලාන එගොඩහේනේ සිරි විසුද්ධාරාමය යන විහාරස්ථානයන්හි අධිපති, කොළඹ නුණුපිටියේ ගංගාරාමස්ථ ශ්‍රී ඥානේශ්වර පිරිවෙනෙහි සහ පානදුර ලයිසියම් ජාත්‍යන්තර අධ්‍යාපන ආයතනයෙහි ආචාර්ය ශාස්ත්‍රපති පූජ්‍යපාද උනාකුරුවේ අරියධජ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

බුදු දහමෙහි ඉගැන්වෙන පුනර්භවය (II කොටස)

පුනර්භවය සිදුවන අයුරු :

සසර පුරාම සත්ත්වයා විසින් කරන ලද කුසලා' කුසල කර්මවල බීජයන්ද ඔහු සතුව පවතී. මෙම ශක්තිය රැඳී පවතින්නේ ඔහුගේ භවාංග චිත්තය තුළය. භවාංගය යනුද මනෝ විඤ්ඤාණයේම අප්‍රකට අංශයකි. ඊට අමතරව මනෝ විඤ්ඤාණයේ ප්‍රකට අංශයක්ද පවතී. තම ජීවිතය මුළුල්ලේ කරන ලද හොඳ-නරක හෙවත් කුසල් -අකුසල් ගැබ්ව පවතින්නේ මෙම මනෝ විඤ්ඤාණය තුළය. මෙය කෝෂ්ඨාගාරයක් බඳුය. මනෝ විඤ්ඤාණය සක්‍රීයව පවතින විට මෙම කුසලා' කුසල ශක්තීන්ගේ බලපෑම පුද්ගලයාට දැනේ.

කෙනකු කල්පනා කරන අවස්ථාව මනෝ විඤ්ඤාණය ක්‍රියාත්මක අවස්ථාවක් ලෙස හැඳින්වේ. සිහින දකින අවස්ථාව ද මනෝ විඤ්ඤාණය ක්‍රියාත්මක වන අවස්ථාවකි. වඩාත් ප්‍රබලව මනෝ විඤ්ඤාණය ක්‍රියාත්මක වන්නේ මරණාසන්න අවස්ථාවකදීය. මරණාසන්න අවස්ථාවේදී සත්ත්වයාගේ ඇස, කණ, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රිය පහම අනුක්‍රමයෙන් අක්‍රීය වේ. එසේ අක්‍රීය වන විට චක්ඛු විඤ්ඤාණය, සෝත විඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය හටගන්නට ක්‍රමයක් නැත. එවිට මනෝ විඤ්ඤාණය පමණක් හටගනී. මනෝ විඤ්ඤාණය හටගන්නවා යනු මනෝ විඤ්ඤාණයේ එතෙක් ගබඩා වී තිබෙන දේවල් ස්මාරණය වීමයි. රූපවාහිනි තිරයේ පෙනී සිටින්නාක් මෙනී.

එහි රූප, ශබ්ද දකින්න අහන්න ලැබෙන්නා සේ සත්ත්වයා ජීවිතය මුළුල්ලේ කරන ලද හොඳ දේත් නරක දේත් ස්මරණය වන්නට (සිහි වන්නට) පටන් ගනී. ඒ අතුරෙන් බලවත් බලවත් දේ වැඩි වැඩියෙන් මනෝ විඤ්ඤාණය තුලින් ගලාගෙන එනු ඇත.

ධර්මයේ සඳහන් වන්නේ, මරණාසන්න අවස්ථාවේ **කර්මයක් හෝ කර්ම නිමිත්තක්** හෝ **ගති නිමිත්තක්** ඉදිරිපත් වෙන බවයි. කර්මයක් ඉදිරිපත් වෙනවා යනු තමන් කරන ලද පුණ්‍ය හෝ පාප ක්‍රියාවක් ඒ ආකාරයෙන්ම සිහිපත් වීමයි. උදාහරණයකට දානයක් දීම වැනි පුණ්‍ය කර්මයක් ගතහොත් එම අවස්ථාව ඒ ආකාරයෙන්ම ස්මරණය වේ. සත්ත්ව ඝාතනයක් වැනි පාප ක්‍රියාවක් නම් සත්ත්ව ඝාතන සිද්ධිය ඒ ආකාරයෙන්ම දර්ශනය වීම සිදුවිය හැක.කර්ම නිමිත්තක් ඉදිරිපත් වීම යනු සම්පූර්ණ ක්‍රියාවම ස්මරණය නොවී එහි එක් අවස්ථාවක් පමණක් දර්ශණය වීමයි. දානමය පිංකමක නම් දන් බෙදන අවස්ථාව, එසේ නැතහොත් ස්වාමීන් වහන්සේ නමක් දානානිංශංස දේශනා කරන අවස්ථාව වැනි අවස්ථාවක් සිහියට ඒම, කර්ම නිමිත්ත වශයෙන් ඉදිරිපත් වීමකි. සත්ත්ව ඝාතනයක් වැනි පාප කර්මයක් නම් සත්ත්වයාට ආයුධයකින් පහර දෙන අවස්ථාව හෝ සත්ත්වයා මරණ වේදනාවෙන් සිටින අවස්ථාව වැනි සිදුවීමක් ස්මරණය වියහැක. ගති නිමිත්ත ඉදිරිපත්වීම යනු පුණ්‍ය ක්‍රියාවට හෝ පාප ක්‍රියාවට අනුරූප සංකේතයක් දර්ශන වීමයි. පුණ්‍යමය සංකේත ලෙස අලංකාර - සිත් පහදන මල්, දිව්‍යමය රූප, පුණ්‍ය භූමි ආදී සංකේත දර්ශණය විය හැක. පාප ක්‍රියාවලට අනුරූප ගිනිදැල්, සර්පයින්, යක්ෂ රූප ආදී සංකේත දර්ශණය විය හැක.

මෙසේ කර්මයක් හෝ කර්ම නිමිත්තක් හෝ ගති නිමිත්තක් සිතට ඉදිරිපත් වෙනවා යන්නෙහි අර්ථය කර්මයට හෝ කර්ම නිමිත්තට හෝ ගති නිමිත්තට අදාල සිද්ධිය සිදුවූ අවස්ථාවේ පැවති සිතට සමාන සිතක් ඇති වීමයි. නිදසුනක් ලෙස සත්ත්ව ඝාතන කර්මයක් සිහිපත් වූයේ නම් අතීතයේ දී සත්ත්ව ඝාතනය කරන ලද අවස්ථාවේ පැවති සිතේ ස්වභාවයට සමාන සිතක් මරණාසන්න මොහොතේදී ඇතිවේ. වධක චේතනාව සහිතව, එනම් ද්වේශ සහගත සිතක් ඇතිවේ. ඒ සමගම මරණය සිදුවිණි නම් හෙවත් සිතක් කයක් වෙන්විනි නම් සිතට භෞතික කයක් අවශ්‍ය වේ. වධක චේතනාවෙන් යුත් චුති චිත්තය ඊට ගැලපෙන තැනක ප්‍රතිසන්ධිය ලබයි. සිතක් එක දිගට නොපවතී. (ක්ෂණයක් පාසා සිත් හටගනිමින් - වීනාශ වෙමින් - නැවත හටගනිමින් චිත්ත ප්‍රවාහය අඛණ්ඩව සිදුවේ.) චුති චිත්තය වර්තමාන ශරීරය ආශ්‍රයෙන් හටගත් අතර ඊලඟ සිත ප්‍රතිසන්ධි චිත්තයයි. එය අළුත් ජීවිතයේ පළමු සිත ලෙසට වෙනත් ශරීරයක් තුළ ඇතිවේ. මෙහිදී සිදුවන විශේෂත්වය නම් චුති චිත්තයේ ස්වභාවයට ගැලපෙන ශරීරයක් ප්‍රතිසන්ධි චිත්තය හටගැනීම පිණිස ලැබීමයි.

"විඤ්ඤාණ පච්චයා නාමරූපං" - විඤ්ඤාණය ප්‍රත්‍ය කරගෙන නාම ධර්ම සහ රූප ධර්ම සැකසෙන බව **'පටිච්චසමුප්පාද'** යේ විස්තර වේ. සත්ත්ව ඝාතක හෙවත් වධක චේතනාවෙන් යුත් ද්වේශ සහගත සිතක් දිව්‍යලෝකයේ ප්‍රතිසන්ධිය නොලබයි. මිනිස් මවුකුසකට හෝ නොඑළඹේ. එය නිරයට - තිරිසන් ලෝකයට වැනි සතර අපාය වලින් එක් තැනකට පිවිසෙනු ඇත. තිරිසන් ලෝකයේ උපතක් පිළිබඳව සිතා බැලුවහොත් කොටි දෙනකගේ පැටවකු පිළිබඳව සළකා බලමු. කොටි පැටවාට උල් දත් ලැබේ. උල් නිය ලැබේ. සත්ත්ව ඝාතනයට අවශ්‍ය ජවය ලැබේ. එවැනි ශරීරයක් ලැබෙන්නේ ප්‍රතිසන්ධි විඤ්ඤාණයට ගැලපීම සඳහාය. සර්ප උපතක් ගැන බැලුවහොත් සර්පයාට විෂ දළ ලැබේ. එවැනි ශරීරයක් ලබන්නට නම් ප්‍රතිසන්ධි චිත්තය වෛරය, ද්වේෂය සහිත සිතක් හෙවත් විඤ්ඤාණයක්ම විය යුතුය.

එසේම මිනිස් මව් කුසක සිදුවිය හැකි උපතක් ගැනද සළකා බලමු. මිනිස් මවු කුසකට පැමිණීමට නම් කුසල විඤ්ඤාණයක්ම විය යුතුය. අලෝභ, අදෝෂ, අමෝහ යන කුසල මූලයන් ගෙන් සමන්විත විඤ්ඤාණයක් විය යුතුය. යුතුය. මෙමගින් පැහැදිලි වන්නේ විඤ්ඤාණයට ගැලපෙන ශරීරයක් ලැබෙන බවයි. එමෙන්ම මරණාසන්න විඤ්ඤාණය හෙවත් චුති චිත්තය ඊට ගැලපෙන ස්ථානය කරා පැමිණෙන බවයි. මෙහිදී තේරුම් ගතයුතු තවත් වැදගත් කරුණක් නම්, මනුෂ්‍ය ශරීරයට ඔරොත්තු දෙන්නේ පවිත්‍ර විඤ්ඤාණයක් බවයි. **ශරීරය විඤ්ඤාණය බහා තබන භාජනයක් වැනිය. ජීවිත කාලය අතරතුර විඤ්ඤාණය ලෝභ - දෝෂ - මෝහයන් ගෙන් කිලිටි වීම විඤ්ඤාණය බහා තබන ශරීරය නමැති භාජනයට විෂ එක්වීමක් වැනිය.** එහි ප්‍රතිඵලය වන්නේ ශරීරය විවිධ ආබාධයන්ට ලක්වීමයි. එබැවින් ශරීරයට බලපාන බොහෝ ආබාධ විඤ්ඤාණය කිලුටට පත්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස හටගන්නා රෝගාබාධයන් විය හැකිය.

බුදු දහමෙහි ප්‍රධාන ඉගැන්වීමක් වන පුනර්භවය වරදවා තේරුම් ගන්නා බොහෝ දෙනා, පුද්ගලයා තුළ ආත්මයක් ඇතැයිද මරණයෙන් පසුව එය වෙනත් තැනක උපත ලබනු ඇතැයි ද සිතා මිථ්‍යා දෘෂ්ටීන්හි ගැලී වාසය කරති. එබැවින් අප සිහි තබා ගත යුතු වැදගත්ම කරුණ නම් පුනර්භවය හෙවත් නැවත වීම මොහොතක් පාසා සිදුවන දෙයක් බවයි. මෙය නාම රූපයන් තුළ හෙවත් චිත්ත - චෛතසික - රූප යන ධර්ම තුන තුලම නිරන්තරයෙන්ම සිදුවන බවය. ශරීරය බිඳී යෑමෙන් සිදුවන පුනර්භවය නම්, ඒ අවස්ථාවේ පවතින විඤ්ඤාණයට ගැලපෙන ශරීරයක් ලැබීම පමණක් බවත්ය. **මේ අනුව කර්මය හා පුනර්භව විශ්වාසය සදාචාර සම්පන්න ජීවිතයක් ගොඩනගා ගැනීමට බෙහෙවින් උපකාරී වේ. එසේම අප උනන්දු විය යුත්තේ, මෙම පැවැත්මම නතර කිරීමටයි. ලෝකය ත්‍රිලක්ෂණයට අනුකූලව (අනිත්‍ය - දුක්ඛ - අනාත්ම) දැක සියල්ල 'අත්හැරීම' ඊට මාර්ගයයි.**

ඔබ හැමට උතුම් නිවන් සැප ලැබේවා!